| එච්. එම්. ජී. බී. කොටකදෙනිය<br>හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | එක්සත් ජනතා නිදහස් සංධානය<br>**ගම්පහ දිස්ත්‍රික්කය** | | |
|---|---|---|---|
| | | **24** | ✗ |

ප්‍රිය සොයුර/ සොයුරිය,

එක්සත් ජනතා නිදහස් සංධානයේ අපේක්ෂකයෙකු ලෙස බස්නාහිර පළාත් සභාවට, ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග වදින මා ගැන සහෝදර රාජ්‍ය සේවකයෙකු වශයෙන් ඔබ තුල කිසියම් මතකයන් ඉතිරිවී ඇතැයි විශ්වාස කරමි. එසේ වුවත්, 2002 වර්ෂයට පසු රාජ්‍ය සේවයට එක්වූ නිලධාරී/ නිලධාරිණියන්ගේ ප්‍රයෝජනය සඳහාත්, ඔබේ මතකය අවදි කිරීම සඳහාත් පහත සටහන තබමි.

**මම ................**



- 1966 දී සහකාර පොලිස් අධිකාරිවරයෙකු ලෙස පොලිස් සේවයට එක්වී උතුර නැගෙනහිරද ඇතුලුව දිවයිනේ විවිධ ප්‍රදේශවල සේවය කොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස 2002 වර්ෂයේදී සේවයෙන් විශ්‍රාම ලැබීමි.
- සෘජු බව අවංකකම හා නීතිගරුක බව ආදර්ශ කර ගත් නිසාම මගේ සේවා දිවිය විවිධ හැලහැප්පීම් වලට ගොදුරු වූවකි. 1988/89 භීෂණ සමයේ ඝාතනයට/ නීති විරෝධී ලෙස රඳවා තැබීමට ලක්වී සිටි අහිංසක තරුණ ජීවිත ගලවා ගැනීමට දකුණ හා වයඹ දිශාභාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් මා ගත් ක්‍රියාමාර්ග නිසා වර්ෂ එකහමාරක් අනිවාර්ය නිවාඩු යාමට සිදුවීම එවැනි එක් උදාහරණයකි.
- කොළඹ ප්‍රදේශය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරයා වශයෙන් අගනුවර ආරක්ෂාව තර කිරීම පිණිස මගෙන් ඉටුවූ කාර්යභාරය වෙනුවෙන්, ඉහළ මහජන ප්‍රතිචාරයකට ලක්වීමට තරම් වාසනාවන්ත වූයෙමි.
- මහජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කොළඹ නගරයේ පාතාල ක්‍රියාකාරකම් මැඩලීමේ හා පදික වෙළෙඳුන් ඉවත් කිරීමේ කාර්යය ආරම්භ කළේ ඊට විරුද්ධ නැගී ආ විවිධ විරෝධතාවලට නොබියව මුහුණ දෙමිනි.
- සත්ව සුභසාධනය හා අවිහිංසාව විෂයයෙහි පුරෝගාමී වූ ප්‍රථම පොලිස් නිලධාරියා වීමි.
- කාන්තා හා ළමා ආරක්ෂක කමිටුවේ සාමාජිකයෙක්ව සිට කාන්තා හා ළමා ආරක්ෂක කොට්ඨාශය අධීක්ෂණය කල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් එම ක්ෂේත්‍රයෙහි විශාල කාර්ය භාරයක් ඉටුකලෙමි.

**මගේ භාර්යාව ..............**



- 1967 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් හා තැපැල්පති තනතුරු දැරූ ප්‍රථම හා එකම නිලධාරිණිය ලෙස රාජ්‍ය සේවයේ නමක් දිනා සිටි කාන්තාවකි. මෝටර් රථ දෙපාර්තමේන්තුමේ පැවති දූෂණ මැඩලීම සඳහාත්, තැරැව්කරුවන් ඉවත් කිරීම සඳහාත්, දෙපාර්තමේන්තු කටයුතු විධිමත් හා කාර්යක්ෂමව කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමත්, නව රියදුරු බලපත් කාඩ්පත හඳුන්වාදීමත් ඇය ආරම්භ කල විශේෂ කාර්ය භාරයන් වේ.
- වෘත්තීය සමිතිවල දැඩි විරෝධතා මධ්‍යයේ තැපැල් දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම සඳහා කටයුතු කල ඇය විශේෂ පහසුකම් සහිත ජාත්‍යන්තර මට්ටමේ නව තැපැල් කාර්යාල හඳුන්වා දීමට පුරෝගාමී වූවාය.
- පෞද්ගලික බස්රථ දෙපාර්තමේන්තුවේ ප්‍රථම අධ්‍යක්ෂකවරිය වශයෙන් පෞද්ගලික බස් රථ ධාවනයට කිසියම් විනයක් ඇතිකිරීමේ අඩිතාලම දමනු ලැබුවේ ඇයයි.
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක ලෙස 2002 වර්ෂයේදී සේවයෙන් විශ්‍රාම ලැබූ ඇය දැනට පෞද්ගලික අංශයේ සේවයේ නිරත වී සිටී.

**මගේ දැක්ම**

ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදාගත් අපේ මව්බිම නැවත ගොඩ නැගීමේ කාර්ය භාරය අද අප මුහුණ දී ඇති ප්‍රධානතම අභියෝගයයි. එම අභියෝගය සාර්ථකව ජයගත හැක්කේ සියලුම ජන කොටස්වල ආශිර්වාදය දිනා ගත

හැකි ආර්ථික ක්‍රියාවලියක් දියත් කිරීමෙන් පමණකි. සදාචාරාත්මක දියුණුවකින් තොරව ආර්ථික සංවර්ධනය අර්ථ විරහිත වූවකි.

එබැවින්, සදාචාරය සුරැකෙන විනිවිදභාවය සහිත සුදුස්සාට නිසිතැන ලැබෙන දූෂණයෙන් තොර යාන්ත්‍රණයක් බිහි කිරීම සඳහා මම කැපවෙමි.

**අපේ ආයාචනය**

රාජ්‍ය සේවය වෙනුවෙන් අපෙන් ඉටුවූ කාර්ය භාරය පිළිබඳ ඔබ තුල ඇති තක්සේරුව අනුව මා හට ඡන්දයක් හා මනාපයක් දීමට තරම් ප්‍රමාණවත් වේයයි ඔබ සිතන්නේ නම් මා වෙනුවෙන් එක්සත් ජනතා නිදහස් සංධානයට ඡන්දයක් දී අංක 24 වෙනුවෙන් මනාපයක් සටහන් කරන ලෙස කාරුණිකව ඉල්ලමු.

**එක්සත් ජනතා නිදහස් සංධානය**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**24**

**එච්. එම්. ජී. බී. කොටකදෙනිය**

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

**සෝමා කොටකදෙනිය**

විශ්‍රාමික අතිරේක ලේකම්


ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු

160, යක්කල පාර, ගම්පහ.

දුර : 0777 275566 (කොටකදෙනිය මහතා), 0602720990

ඊ-මේල් : kotake@sltnet..lk


# ඡන්දයක් දෙන්න වටිනම කෙනෙක් කොට්බල නැසූ සටනේ

# සැබෑ විරුවෙක්



එක්සත් ජනතා නිදහස් සංධානය

**ගම්පහ දිස්ත්‍රික්කය**

**24**

ඔහුට...
වඩා සුදුස්සෙක්
තවත් සිටී ද ?

# පිබිදෙන මව්බිමට වීරෝදාර නායකයෙක්



**24**

එක්සත් ජනතා නිදහස් සංධානය

**ගම්පහ දිස්ත්‍රික්කය**

හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

# එච්. එම්. ජී. බී කොටකදෙනිය